00310

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

මුල් ළමාවිය හා ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ

ඩිප්ලෝමා වැඩසටහන - 3 වන මට්ටම

අවසාන පරීක්ෂණය - 2013

ESD1231 – විෂයමාලා අධ්‍යාපනය හා ප්‍රායෝගික වැඩ - භාෂා සංවර්ධනය

කාලය - පැය 03 යි.

---

දිනය - 2013.12.08 වේලාව - පෙ.ව. 09.30 - ප.ව.12.30

---

I කොටසේ <u>සියළුම</u> ප්‍රශ්නවලටද II කොටසේ තෝරාගත් ප්‍රශ්න <u>තුනකට ද</u> පමණක් පිළිතුරු සපයන්න.

<u>I කොටස</u>

01. භාෂාව යනු කුමක් ද?

02. මානව භාෂාවේ හඳුනාගත හැකි ලක්ෂණ තුනක් (03) ලියන්න.

03. "ක්‍රියාකාරී ප්‍රාථමික පන්ති කාමරය" යන්න කෙටියෙන් විස්තර කරන්න.

04. "අභිමත ඉගෙනුම් නිපුණතා" යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද?

05. කථන භාෂාවේ වර්ග හතරක (04) ලක්ෂණ හඳුනාගත හැකි වේ. ඒවා මොනවා ද?

06. 2 ශ්‍රේණියේ ළමුන් සඳහා ගැළපෙන පහත දැක්වෙන අභිමතාර්ථය සඳහා උදාහරණයක් ලියන්න.
"වින්දනය සඳහා සවන්දීම"

07. 3 ශ්‍රේණියේ ළමුන්ගේ ලිවීමේ කුසලතා වර්ධනය කළහැකි ඉගැන්වීමේ ආධාරක දෙකක් (02) කෙටියෙන් පැහැදිලි කරන්න.

08. ප්‍රාථමික ශ්‍රේණි සඳහා හඳුන්වා දෙන ලද අවිධිමත් තක්සේරු කිරීමේ ක්‍රමවේද වලින් ලැබෙන වාසි තුනක් (03) ලියන්න.

(ලකුණු 5 x 8 = 40)



21

## II වන කොටස

09. (i) අතීතයේ මිනිසා භාවිත කරන ලද සන්නිවේදන ක්‍රම තුනක් (03) සඳහන් කරන්න. (ලකුණු 06)

(ii) භාෂාව ග්‍රහණය කර ගැනීමේ පූර්ව සංකල්පන අවධියේ භාෂා සංවර්ධනයෙහි ලා හඳුනාගත හැකි ලක්ෂණ තුනක් (03) ලියන්න. (ලකුණු 06)

(iii) භාෂාවේ ඉතා වැදගත් ක්‍රියාකාරීත්වයන් දෙකක් (02) විස්තර කරන්න. (ලකුණු 08)

10. (i) 1997 නව ප්‍රාථමික අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ හඳුන්වා දෙන ලද ප්‍රධාන ලක්ෂණ තුනක් (03) පැහැදිලි කරන්න. (ලකුණු 08)

(ii) 1997 විෂයමාලා ප්‍රතිසංස්කරණ සඳහා වූ මූලික අවස්ථා පෙළ ගැස්මේ හඳුනාගත හැකි ප්‍රධාන සාධක උදාහරණ දෙමින් විස්තර කරන්න. (ලකුණු 12)

11. කිසියම් පාඩමක් සඳහා අදාළ ඉගැන්වීමේ ආධාරකයක් තෝරා ගැනීමේ දී ගුරුවරයා ප්‍රවේසම් විය යුතුවේ.

(i) ඔබ I ශ්‍රේණියේ ළමුන් සඳහා කවියක් උගන්වන්නේ නම් එම පාඩමෙන් අවධානයෙන් යුතුව සවන් දී රසවිඳීමට ලක් කිරීම පෝෂණය කරන්නේ කෙසේ ද? (ලකුණු 10)

(ii) ඔබ තෝරා ගන්නා ලද පාඩම සඳහා පින්තූරයක් භාවිත කරන්නේ නම් එහි ඵලදායීතාවය විස්තර කරන්න. (ලකුණු 10)

12. සිසුන් ධෛර්යමත් කිරීම සඳහා පෝස්ටර්, පින්තූර, ක්‍රියාකාරකම් පත්‍රිකා ආදී දෑ භාවිත කරමින් සිත් ඇද ගන්නා පන්ති කාමරයක් සකස් විය යුතුය.

(i) මෙම ප්‍රකාශය සමඟ ඔබ එකඟ වන්නේ ද? හේතු තුනක් (03) ලියන්න. (ලකුණු 06)

(ii) 3 ශ්‍රේණියේ කියවීමේ හැකියාව ධෛර්යමත් කිරීම සඳහා උචිත පණිවිඩයක් ඇතුළත් පෝස්ටරයක් අඳින්න. (ලකුණු 08)

(iii) මෙම පණිවිඩය කැපී පෙනෙන ලෙස සඳහන් කිරීම සලකා බැලිය යුත්තේ ඇයි හේතු තුනක් (03) ඉදිරිපත් කරන්න. (ලකුණු 06)

13. පහත සඳහන් මාතෘකා අතරින් දෙකක් (02) තෝරාගෙන උදාහරණ දෙමින් පැහැදිලි කරන්න.

(i) ලිවීමේ දුෂ්කරතා

(ii) වඩාත් හොඳ පන්ති කාමර වාතාවරණයක දැකිය හැකි ලක්‍ෂණ

(iii) වාග්මාලා දියුණු කර ගැනීම

(iv) අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා

(ලකුණු 10 x 2 = 20)

හිමිකම් ඇවිරිණි.

**THE OPEN UNIVERSITY OF SRI LANKA**
**FACULTY OF EDUCATION**
**FINAL EXAMINATION – 2013**

**DIPLOMA IN EARLY CHILDHOOD & PRIMARY EDUCATION – LEVEL 3**
**ESD1231 – CURRICULUM STUDIES AND PRACTICUM**

**DURATION – THREE (03) HOURS.**

---

Date: 08th December 2013 Time: 9.30 a.m.- 12.30 p.m.

---

Answer all questions in Part I and any three from Part II.

## PART I

01. Define what is language?

02. Write **three (03)** characteristics of human language.

03. Describe in brief "active primary classroom".

04. What is meant by desirable learning competencies.

05. There are **four (04)** types of characteristics in articulation. What are they?

06. Write an example for the following objective suitable for grade 2 children.

    "Listening for enjoyment"

07. Explain in brief **two (02)** teaching aids to develop writing skills for children in grade 3.

08. Write **three (03)** advantages of informal assessment methods introduced in primary grades.

(5 x 8 = 40 marks)

## PART II

09. i. State **three (03)** forms of communication man used at the beginning.

(06 marks)

ii. Write done **three (03)** characteristics of language development in a child in early production stage in language acquisition.

(06 marks)

iii. Describe the **two (02)** vital role played by language.

(08 marks)

10. i. Explain **three (03)** main characteristics introduced under the new primary education reforms of 1997.

(08 marks)

ii. Describe citing examples the major factors that can be indentified from the array of basic needs for curriculum reforms of 1997.

(12 marks)

11. "The teacher has to be careful in selecting an appropriate teaching aid for an particular lesson"

i. Supposing you are teaching a poem to grade 1 children. How would you enrich your lesson to attentive listening and appreciating?

(10 marks)

ii. Describe the effectiveness of using a picture with the lesson you have selected.

(10 arks)

12. Teacher should encourage students to make the classroom attractive using posters, pictures activity card… etc.

   i. Do you agree with this statement? Write **three (03)** reasons.

   (06 arks)

   ii. Draw a suitable message for a poster to encourage reading abilities in grade 3 students.

   (08 marks)'

   iii. Why do you think to consider this message striking? Give **three (03)** reasons.

   (06 marks)

13. Select **two (02)** topics out of topic mentioned below and explain them with examples.

   i. Difficulties in writing.

   ii. Characteristics of a good classroom atmosphere.

   iii. Improvement of the vocabulary.

   iv. Essential learning competencies.

   (10 x 2 = 20 marks)

- *Copyrights reserved* -